**LING E 3025**
**භාෂා දුබලතා, සමාජ හා ව්‍යවහාරික වාග්විද්‍යාව**
**අනිවාර්ය පාඨමාලාව**

**අභිමතාර්ථ :**

- සන්නිවේදන දුබලතා හඳුන්වා දීම සහ එම දුබලතා විස්තර කිරීම. වාග්විද්‍යාව මඟින් මෙම දුබලතා මගහරවා ගැනීමට උපකාර කළ හැකිදැයි වාග්විද්‍යාත්මකව විමසා බැලීම.
- භාෂාව හා සමාජය අතර අන්තර් සබඳතාව පිළිබඳව විද්‍යාර්ථීන් දැනුවත් කිරීම.
- යථෝක්ත අන්තර් සබඳතාව හේතුවෙන් භාෂක සමාජ අතර පැන නැගී ඇති ගැටලු පිළිබඳ අවධානය යොමු කිරීම.
- ඉහත අන්තර් සබඳතා පිළිබඳ විවිධ සමාජ වාග්විද්‍යාඥයන් දක්වා ඇති න්‍යාය සහ උපන්‍යාස අධ්‍යයනය කිරීම.
- භාෂක සමාජය, උපභාෂා, ද්විරූපතාව සහ ද්විභාෂකත්වය වැනි සංකල්ප හඳුනා ගැනීමට ශිෂ්‍යයන්ට උපකාර කිරීම.
- සමාජීය, සංස්කෘතික හා අධ්‍යාපන ක්ෂේත්‍රවල භාෂාව හා සම්බන්ධ ගැටලු අවබෝධ කර ගැනීමේ හැකියාව වර්ධනය කිරීම.
- එම ගැටලු පැහැදිලි කිරීමට හෝ විසඳා ගැනීමට හෝ යොදාගත හැකි වාග්විද්‍යාත්මක න්‍යාය හා සංකල්ප අධ්‍යයනය කිරීම.
- සාමාන්‍ය වාග්විද්‍යාව හා ව්‍යවහාරික වාග්විද්‍යාව පදනම් කරගෙන, භාෂා ඉගෙනීම හා ඉගැන්වීම පිළිබඳ පුළුල් දැක්මක් ඇති කිරීම.
- වාග්විද්‍යාව හා මෑතක දී සංවර්ධිත ඉගැන්වීමේ ක්‍රම අතර සබඳතාව අවබෝධ කර ගැනීම.

**ඉගෙනුම් ඵල :**

භාෂණ දුබලතා -
මෙම පාඨමාලාව අවසානයේ ශිෂ්‍යයාට,

- භාෂණ දුබලතා හඳුනා ගැනීමට හා එම දුබලතා ඇති පුද්ගයන්ට උපකාර කිරීමට හැකිවනු ඇත.

සමාජ වාග්විද්‍යාව -

- භාෂාව හා සමාජය අතර සබඳතාව හඳුනාගැනීම.
- ශ්‍රී ලංකික භාෂක සමාජ සහ ඔවුන්ගේ භාෂාමය ගැටලු හඳුනා ගැනීමට සමාජ වාග්විද්‍යාත්මක දැනුම යොදා ගැනීම.

ව්‍යවහාරික වාග්විද්‍යාව -

- විවිධ ක්ෂේත්‍රවල භාෂණ ගැටලුවල හඳුනාගෙන, ඒවා පැහැදිලි කිරීමට වාග්විද්‍යාව අනුයෝග කරගන්නේ කෙසේද යන්න පැහැදිලි කිරීම.
- භාෂා ඉගැන්වීමේ හා ඉගැන්වීමේ ක්‍රියාවලියට සුදුසු, වාග්විද්‍යාත්මක න්‍යාය, සංකල්ප හා ක්‍රම (නිශ්චිතව හඳුනා ගැනීම)
- ව්‍යවහාරික වාග්විද්‍යාත්මක දෘෂ්ටිකෝණයෙන් භාෂාව අර්ථකථනය.
- භාෂා ඉගැන්වීමේදී භාවිත වන ප්‍රතිරොධාත්මක විශ්ලේෂණය හා දෝෂ විශ්ලේෂණය යන වාග්විද්‍යාත්මක ශිල්පීයක්‍රමයන් විග්‍රහ කිරීම.
- භාෂා ඉගෙනීමේ ක්‍රියාවලියට අදාළ කරුණු පැහැදිලි කිරීම.
- සංස්ථිතික හා සමාජ වාග්විද්‍යාව සහ විවිධ ඉගැන්වීමේ ක්‍රම අතර සම්බන්ධතාවය හඳුන්වා දීම.

**අන්තර්ගතය :**

භාෂණ දුලබතා -

- භාෂා අවබෝධය, නිශ්පාදනය, භාෂා දාමය සහ මොළයේ ක්‍රියාකාරීත්වය හා සම්බන්ධ භාෂාවේ සංජානන ක්‍රියාවලිය ජීව විද්‍යාත්මක දෘෂ්කෝණයකින් විග්‍රහ කිරීම.
- භාෂණ ක්‍රියාවලියේ දී වැදගත් වන උච්චාරණ හා ශ්‍රවණ ඉන්ද්‍රිය පද්ධතිය පිළිබඳ අධ්‍යයනය කිරීම.
- විවිධ දුබලතා සහ විවිධ භාෂණ දුබලතා, උච්චාරණ දුබලතා, අර්ථ හා ප්‍රකරණාත්මක දුබලතා, කියවීමේ හා ලිවීමේ දුබලතා, ශබ්ද, පදිම හා වාක්‍ය විචාරාත්මක දුබලතා හඳුනා ගැනීම.
- පෝල් බ්‍රෝකා, කාර්ල් වර්නිකේ වැනි චිකිත්සකයින් සහ ස්නායු විශේෂඥයින් හඳුන්වා දී ඇති විවිධ පර්යේෂණ හා සොයා ගැනීම්.

සමාජ වාග්විද්‍යාව -

- න්‍යාය : ඩෙල් හයිම්ස්, වෝර්ඩ්හෝග්, විලියම් ලැබෝව් සහ චාර්ල්ස් ෆර්ගියුසන් වැනි සමාජ වාග්විද්‍යාඥයින් හඳුන්වා දී ඇති න්‍යාය හා අදහස්.
- සන්නිවේදන ශක්‍යතාව, වාග්විද්‍යාවේ අනු ශාඛා, සමස්ථ වාග්විද්‍යාතමක විෂය ක්ෂේත්‍රය, නාගරික හා ග්‍රාමීය උපභාෂා විචාරය, භාෂා ද්විරූපතාව සහ ද්විභාෂකත්වය.

ව්‍යවහාරික වාග්විද්‍යාව -

- ව්‍යවහාරික වාග්විද්‍යාවේ ක්ෂේත්‍රය

- ව්‍යවහාරික වාග්විද්‍යාවට අනුව භාෂාව සම්බන්ධ අර්ථකථනය හා වර්ගීරණ
- සංස්ථිතික වාග්විද්‍යාව හා භාෂා ඉගැන්වීම
- සමාජ වාග්විද්‍යාව හා භාෂා ඉගැන්වීම
- දෙවන හා විදේශ භාෂා ඉගැන්වීමේ ක්‍රමවේද ; ප්‍රතිරෝධාත්මක හා දෝෂ විශ්ලේෂණය
- භාෂා ඉගෙනුම් කරුණු
- වාග්විද්‍යාව අදාළ ඉගැන්වීමේ ක්‍රම

**ඇගයීම් :**

වර්ෂ අවසාන පරීක්ෂණය : පැය තුනක (03)ප්‍රශ්න පත්‍රය.

**නිර්දේශිත කියවීම්:**


Crystal, D. (1980). *Introduction of Language Pathology*.

Crystal, D. *Encyclopedia of language.*

Crystal, D. (1994). *An Encyclopedic Dictionary of Language andLanguages*, Penguin Books. (First published 1992).

Gumper, John J. (1971). *Language in Social Groups*, Stanford: Stanford University press.

Holemess, Janet. (1993). *An Introduction to Sociolinguistics*, London: Longman. (First published 1992)

Hymes, Dell. (1974). *Foundation in Sociolinguistics*, Philadelphia: University of Philadephia press.

McArthur, Tom. (1991). *A Foundation course for language Teachers*, Cambridge: Cambridge University press. (First published 1983).

Stern, H.H. (1987). *Fundamental concepts of Language Teaching*, Oxford: Oxford University press. (First published 1983)

Lenneberg, E.H. (1967). *Biological foundation of language*.

Whiteker, h., Neuro linguistics.

වික්‍රමසිංහ, ඩී. එම්. *ශ්‍රව්‍යාබාධිත අධ්‍යාපන ක්‍රමයේ නමුතා: වාග්විද්‍යා 8,* වාග්විද්‍යා අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය.

ධර්මදාස, කේ. එන්. ඕ. (1996), *භාෂාව හා සමාජය (වාග්විද්‍යාත්මක ගවේෂණයක්)* කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ,

බලගල්ලේ, විමල්. (1995). *භාෂා අධ්‍යයන හා සිංහල ව්‍යාවහාරය.* කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ,

ජයසේකර, චිත්‍රා. රාජපක්ෂ, ආර්. එම්. ඩබ්ලිව්. දැල බණ්ඩාර, ගාමිණී (1996). *වාග්විද්‍යාත්මක ලිපි (ආනන්ද ජයසේකර),* කැලණිය: සම්භාව්‍ය ප්‍රකාශනග

වික්‍රමසිංහ, ඩී. එම්. වීරකෝන්, හේමා, (1986/87), *වාග්විද්‍යා 3,* වාග්විද්‍යා අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය